මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, අංක.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**LAE/2025/89** **2025.05.03**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06
## අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාල සැරසිලි ඉවත් කිරීම

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කරනු පිණිස සහ මැතිවරණ නීති උල්ලංඝනය වීම වැළැක්වීම සඳහා නිවේදිත ඡන්ද කාර්යාල ප්‍රචාරක කටයුතු සම්බන්ධයෙන් පහත කරුණුවලට අනුකූලතාව දැක්වීමෙන් සහ ක්‍රියා කිරීමෙන් සහාය වන ලෙස සියලුම අපේක්ෂකයන්, ඡන්ද නියෝජිතයන්, බලයලත් නියෝජිතයන්, ප්‍රාදේශීය නියෝජිතයන් හා ඔවුන්ගේ ආධාරකරුවන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

නිවේදිත කාර්යාලවල ප්‍රචාරක කටයුතු පවත්වා ගෙන යාම;

- පළාත් පාලන ආයතන මට්ටමින් සහ ඡන්ද කොට්ඨාස මට්ටමින් දැනට පිහිටුවා ඇති අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාලයක වුවද එම කාර්යාල හැඳින්වීම සඳහා වූ වර්ග අඩි 60 නොඉක්ම වූ ප්‍රචාරක පුවරුව හැර අන් සියලු ප්‍රචාරක පුවරු, පෝස්ටර් හෝ සැරසිලි ප්‍රදර්ශන, අපේක්ෂකයා ගමන් ගන්නා වාහනයේ ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් හා වෙනත් කිසිදු අයුරක ප්‍රචාරක කටයුතු **2025.05.03** දින මධ්‍යම රාත්‍රියෙන් පසු සිදු නොකළ යුතු ය. එලෙස අවසර ලබා දී ඇති වර්ග අඩි 60 ක් නොඉක්මවන උක්ත පුවරුවේ පක්ෂය/ ස්වාධීන කණ්ඩායමේ නම, කොට්ඨාසය හැර වෙනත් ඡායාරූප, ලාංඡන, වැනි අන්තර්ගත කර ඇත්නම් ඒවාද ආවරණය කිරීමට කටයුතු කළ යුතු ය.

**2025.05.04** දින පෙරවරුවේ ඉහත උපදෙස්වලට පටහැනිව පවත්වා ගෙන යනු ලබන කාර්යාල පරීක්ෂා කිරීමට දිස්ත්‍රික්/ ප්‍රාදේශීය පැමිණිලි කළමනාකරණ ඒකකවල පොලිස් නිලධාරීන්ගෙන් හා විමර්ශන නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායම් පැමිණෙනු ඇත. අවසරලත් නිවේදිත පක්ෂ කාර්යාලවල ඇති ප්‍රචාරක පුවරු ඉවත් කරවීම **2025 මැයි මස 04** දින සිට සිදු කරන අතර, ඡන්ද විමසීම නීතියට අනුකූල නොවන ලෙස පවත්වාගෙන යන කාර්යාල වෙතොත් ඒවා ඉවත් කිරීමටද පියවර ගනු ලැබේ.

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්